සිංහල පරිවර්තනය

**පාරිභෝගික ණය පනත මඟින් නියාමනය කරන කුලී සින්නක්කර ගිවිසුම**

**ගිවිසුම් අංකය**

**පළමු පාර්ශ්වය** ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 84, රජ වීදිය, මහනුවර යන ලිපිනයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, එකී ජනරජයේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක PQ 67 දරන **සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී** සමාගම (මෙහි මින්මතු එකී "අයිතිකරු" වශයෙන් හඳුන්වන සහ සඳහන් කරන සහ මෙම ගිවිසුමේ දී භාවිතා කරන පරිදි එකී පාඨය හෝ පදය මඟින් එකී **සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී සමාගම** සහ එහි අනුප්‍රාප්තිකයන් සහ අවසරලත් පැවරුම්ලාභීන් අදහස් වන ඇතුළත් වන බවට මෙම ගිවිසුමේ අවශ්‍ය වන තැන්හි දී එපරිද්දෙන්ම නියම කරන්නා වූ හෝ පිළිගන්නා වූ,) සහ

**දෙවන පාර්ශ්වය** ලෙස මෙහි පහත "අ" උපලේඛනයේ 1 වන අයිතමයේ දක්වා ඇති තැනැත්තා/තැනැත්තන්/ආයතනය/ආයතන (මෙහි මින්මතු එකී "කුලී ගැණුම්කරු" වශයෙන් හඳුන්වන සහ සඳහන් කරන සහ මෙම ගිවිසුමේ දී භාවිතා කරන පරිදි එකී පාඨය හෝ පදය මඟින්, තැනැත්තෙකු හෝ තැනැත්තන් වන විටක දී, එකී තැනැත්තා හෝ තැනැත්තන් සහ ඔහුගේ හෝ ඔවුන්ගේ උරුමක්කාරයන්, පෝල්ම:කරුවන්, අද්මිනිස්ත්‍රාසිකාරයන් සහ අවසරලත් පැවරුම්ලාභීන් ද, ආයතනය හෝ ආයතන වන විටක දී, එකී ආයතනය හෝ ආයතන සහ එහි හෝ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයින් සහ අවසරලත් පැවරුම්ලාභීන් අදහස් වන ඇතුළත් වන බවට මෙම ගිවිසුමේ අවශ්‍ය වන තැන්හි දී එපරිද්දෙන්ම නියම කරන්නා වූ හෝ පිළිගන්නා වූ,) අතර ඇති කරගන්නා වූ **කුලී සින්නක්කර ගිවිසුමයි.**

අයිතිකරු විසින් කුලී ගැණුම්කරුගේ ඉල්ලීම පරිදි, මෙහි පහත "අ" උපලේඛනයේ (2) වන අයිතමයේ සවිස්තරව දැක්වෙන උපකරණය ("උපකරණය") මිලට ගෙන ඇති අතර, සහ/හෝ මිලදී ගැනීමට එකඟ වී ඇති අතර/හෝ උපකරණ සපයාගෙන ඇති අතර, මෙම ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි මත සහ සංශෝධිත 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ ("පනත") දක්වා ඇති විධිවිධාන මත එම උපකරණh කුලී ගැණුම්කරුට කුලියට දීමට එකඟ වී ඇති බැවින් ද; සහ

පනතේ 3(1) වගන්තියට අනුකූලව, මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පෙර, අයිතිකරු විසින් කුලී ගැණුම්කරු ලිඛිතව ආමතා, මෙහි පහත "අ" උපලේඛනයේ (3) වන අයිතමයේ දක්වා ඇති දිනයේ දී, කුලී ගැණුම්කරු විසින් උපකරණ මුදලට මිලදී ගත හැකි මිල ("අත්පිට මිල") (Cash Price) දක්වා ඇති බැවින් ද;

**එසේ හෙයින්**, මෙහි එක් එක් පාර්ශ්වයන් විසින්, මෙහි දැක්වෙන පරිදි, ඔවුන්ගේ අදාළ බැඳීම් ඉටුකිරීම, පිළිපැදීම සහ සපුරාලීම සැලකිල්ලට ගනිමින්, මෙම ගිවිසුමෙන් මෙහි පහත පරිදි එකඟ වන බවට සාක්ෂි දරන වග මෙසේය.

**1. උපකරණ කුලියට දීම**

අ) කුලී ගැණුම්කරු විසින් මෙහි පහත "ආ" උපලේඛනයේ සඳහන් මාසික කුලිය අනලස්ව සහ නිසි කලට ගෙවීමට යටත්ව සහ මෙම ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි කුලී ගැණුම්කරු විසින් නිසි ලෙස පිළිපැදීමට සහ ඉටුකිරීමට යටත්ව, එකී උපකරණය, මෙහි පහත "අ" උපලේඛනයේ (8) වන අයිතමයේ දැක්වෙන කාලසීමාව තුළ, අයිතිකරු විසින් කුලියට දීමට එකඟ වන අතර, කුලී ගැණුම්කරු විසින් කුලියට ගැනීමට මෙයින් එකඟ වේ.

ආ) මෙම ගිවිසුම යටතේ, කුලී ගැණුම්කරුට උපකරණh භාරදෙන ආකාරය සහ කුලී ගැණුම්කරු විසින් උපකරණh පිළිගන්නා ආකාරය මෙහි පහත "අ" උපලේඛනයේ සවිස්තව දක්වා ඇත.

**2. උපකරණයේ භාරකාරත්වය, භාවිතා කිරීම, නඩත්තු කිරීම සහ වෙනස් කිරීම සම්බන්ධයෙන් කුලී ගැණුම්කරුගේ බැඳීම**

අ) මෙහි 2 වන වගන්තියේ දක්වා ඇති විධිවිධානවලට අමතරව, කුලී ගැණුම්කරු විසින් උපකරණය මෙහි 1 වන ඇමුණුමේ දක්වා ඇති ආකාරයට සහ අයිතිකරු විසින් මෙම ගිවිසුමේ කාලසීමාව තුළ කලින් කලට කුලී ගැණුම්කරුට නිකුත් කරනු ලැබිය හැකි ලිඛිත මාර්ගෝපදේශවලට අනුකූලව භාවිතා කිරීම සහ නඩත්තු කිරීම කළ යුතුය.

ආ) මෙහි පහත I වන උපලේඛනයේ (6) වන අයිතමයේ සවිස්තව දක්වා පරිදි, කුලී ගැණුම්කරු විසින් උපකරණය, එය කුලියට ගෙන ඇති කාර්ය සඳහා පමණක් භාවිතා කළ යුතු වන අතර, උපකරණ භාවිතා කරනු ලබන කාර්යෙහි සිදුවන යම් කවරම වූ වෙනසක් පිළිබඳව අයිතිකරුට ලිඛිතව වහාම දැනුම් දිය යුතුය.

ඇ) කුලී ගැණුම්කරු විසින් මෙම ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල නොවන භාණ්ඩ භාවිතා කරන්නේ නම්, එවැනි භාවිතයකින් හෝ භාවිත කරන කාලය තුළ උපකරණයට සිදුවන යම් කවරම වූ හානියක් සඳහා අයිතිකරුට වන්දි ගෙවීමට කුලී ගැණුම්කරු බැඳී සිටිය යුතුය.

ඈ) සාමාන්‍ය විචක්ෂණශීලී මිනිසෙකු විසින් මෙහි සඳහන් උපකරණයට සමාන වන තමාගේම උපකරණය සම්බන්ධයෙන් දක්වන මනා සැලකිල්ල තරමටම මෙහි සඳහන් උපකරණය සම්බන්ධයෙන් ද ඒ හා සමාන තත්වයන් යටතේ, සැලකිල්ල දැක්වීමට කුලී ගැණුම්කරු බැඳී සිටිය යුතුය.

ඉ) ඉහත 2(ඇ) වගන්තියේ සවිස්තරව පැහැදිලි කර ඇති පරිදි, උපකරණh මනාලෙස ආරක්ෂා කරගැනීම පැහැර හැරීමෙන් සිදුවන ඕනෑම හානියක් සඳහා අයිතිකරුට වන්දි ගෙවීමට කුලී ගැණුම්කරු බැඳී සිටිය යුතුය.

ඊ) උපකරණයට කිසියම් අලාභයක්, විනාශයක් හෝ පරිහානියක් සිදුවී ඇති අවස්ථාවක, ඉහත 2(ඇ) වගන්තියේ සවිස්තරව පැහැදිලි කර ඇති පරිදි, උපකරණh මනාලෙස සුරක්ෂිත කරගැනීමට කුලී ගැණුම්කරු විසින් කටයුතු කරන බව සනාථ කිරීම ඔහුගේ/ඇයගේ වගකීම විය යුතුය.

උ) කුලී සින්නක්කර ගිවිසුම අඛණ්ඩව පවත්වාගෙන යාමේ දී හෝ නොයාමේ දී, සෑම අවස්ථාවක දී ම, උපකරණය නිසා හෝ ඊට අදාළව ඇති වන හදිසි අනතුරකින් හෝ සිදුවීමකින් පැන නඟින, තෙවන පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන සියළුම සාධාරණ හිමිකම්පෑම් කුලී ගැණුම්කරු විසින් ගෙවා දැමීම, පියවා දැමීම, ඉටුකිරීම සිදුකළ යුතු වන අතර, මෙම ගිවිසුමේ 4 වන වගන්තියේ සවිස්තරව සඳහන් කර ඇති පරිදි, සියළුම හිමිකම්පෑම්වලින් අයිතිකරු නිදහස් කර, හානිපූරණය කිරීම කළ යුතුය.

ඌ) උපකරණය භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ගබඩා කිරීම හේතුවෙන් හෝ ඊට ආනුෂංගික ලෙස ඇතිවන උපකරණය සම්බන්ධයෙන් වන සියළුම අවදානම් සහ වගකීම්, සහ උපකරණය එවැනි භාවිතයක්, ක්‍රියාත්මක කිරීමක් හෝ ගබඩා කිරීමක් හේතුවෙන් හෝ ඊට ආනුෂංගික ලෙස ඇතිවන යම් තැනැත්තෙකුගේ තුවාල හෝ මරණය, සහ/හෝ උපකරණයට සිදුවන හානි, එහි දී, යම් තැනැත්තන්ට, කුලී ගැණුම්කරුගේ නියෝජිතයින්ට හෝ සේවකයින්ට හෝ තෙවන පාර්ශ්වයන්ට සිදුවන තුවාල හෝ මරණය සහ උපකරණයට සිදුවන හානි කුලී ගැණුම්කරුගේ හෝ වෙනත් අයගේ වන අවස්ථාවක දී වුව ද, කුලී ගැණුම්කරු විසින් භාරගනු ලැබිය යුතුය.

එ) මෙම ගිවිසුමේ කුමක් සඳහන් වුව ද, උපකරණය තෝරා ගැනීමේ දී හෝ සැපයුම්කරු හෝ උපකරණයේ පිරිවිතරයන් තෝරා ගැනීමේ දී අයිතිකරුගේ මැදිහත්වීමේ දී, අයිතිකරුගේ කුසලතාව සහ විනිශ්චය මත කුලී ගැණුම්කරු විශ්වාසය නොතැබිය යුතු බවට කුලී ගැණුම්කරු මෙයින් එකඟ වේ.

## සිංහල පරිවර්තනය

### 3. උපකරණයේ හිමිකම සහ සන්තකය

අ) මෙම ගිවිසුමේ කාලසීමාව තුළ උපකරණයේ පරම අයිතිය සහ හිමිකම අයිතිකරු සතු වන බව කුලී ගැණුම්කරු පිළිගන්නා අතර, ඒ අනුව , කුලී ගැණුම්කරු විසින් උපකරණ විකිණීම, උපබද්දට දීම හෝ පැවරීම හෝ උපකරණයට කිසිදු නෛතික අවහිරතාවක්, උකසක් හෝ ඇපයක් ආරෝපණය කිරීම හෝ මෙම ගිවිසුම යටතේ උපකරණය සම්බන්ධයෙන් අයිතිකරුගේ හිමිකම සහ එහි කුලියට දීම හීනකරන වෙනත් යම් කවරම වූ ක්‍රියාවක් සිදුකිරීම නොකළ යුතුය. මෙම පොරොන්දු උල්ලංඝනය කිරීමක්, සංශෝධිත 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 17 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, අපරාධ නඩුකර පැවරීමකට හේතු වේ.

ආ) කුලියට ගත් උපකරණය කුලී ගැණුම්කරු විසින් සැම විටම ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ සන්තකයේ සහ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ පාලනය යටතේ සහ මෙයින් එකඟ වූ ස්ථානයේ තබාගත යුතුය.

ඇ) උපකරණය තබාගත යුතු ස්ථානය මෙහි පහත "අ" උපලේඛනයේ (7) වන අයිතමයේ දක්වා ඇත.

### 4. හානිපූරණය

අ) උපකරණය හෝ කුලී ගැණුම්කරු හෝ හෝ කුලී ගැණුම්කරුගේ සේවකයින් හෝ නියෝජිතයන් විසින් උපකරණ භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ ගබඩා කිරීම හෝ ප්‍රෝක්ත භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ ගබඩා කිරීම සම්බන්ධයෙන් හෝ එයින් පැන නඟින හෝ ඊට ඇදුණු හෝ ඒ පිළිබඳ හෝ ඊට ආනුෂංගිකව යම් තැනැත්තෙකු විසින්අයිතිකරුට එරෙහිව සිදුකළ හැකි යම් කවරම වූ සහ සියළුම හිමිකම් පෑම්, දණ්ඩන, හානි, පාඩු යනාදි කිසිවකට එරෙහිව කුලී ගැණුම්කරු විසින් අයිතිකරු නිදහස් කර, හානිපූරණය කළ යුතු වන අතර, කුලී ගැණුම්කරු සමඟ ඒකාබද්ධව හෝ අන්‍යාකාරයකින් අයිතිකරුට එරෙහිව යම් කවරම වූ අධිකරණයක්, විනිශ්චය සභාවක්, විනිශ්චය සංසදයක්, තැනැත්තෙක් හෝ ආයතනයක් ඉදිරියේ එවැනි හිමිකම් පෑමක් හෝ දණ්ඩනයක් සම්බන්ධයෙන් යම් කවරම වූ තැනැත්තෙකු විසින් ගෙන එනු ලබන යම් කවරම වූ නඩුකරයක, නඩුවක හෝ නඩු කටයුත්තක දී අයිතිකරුගේ නඩු කීමේ සහ අනෙකුත් සියළු වියදම් කුලී ගැණුම්කරු විසින් දැරිය යුතු වන අතර, අයිතිකරුට එරෙහිව එවැනි අධිකරණයක්, විනිශ්චය සභාවක්, විනිශ්චය සංසදයක්, තැනැත්තෙක් හෝ ආයතනයක් විසින් කරන යම් කවරම වූ නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, නියෝගයක්, තීරණයක් හෝ දණ්ඩනයක් කුලී ගැණුම්කරු විසින් ඉටුකළ යුතුය.

ආ) උපකරණය හෝ කුලී ගැණුම්කරු හෝ හෝ කුලී ගැණුම්කරුගේ සේවකයින් හෝ නියෝජිතයන් විසින් උපකරණ භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ ගබඩා කිරීම හෝ ප්‍රෝක්ත භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ ගබඩා කිරීම සම්බන්ධයෙන් හෝ එයින් පැන නඟින හෝ ඊට ඇදුණු හෝ ඒ පිළිබඳ හෝ ඊට ආනුෂංගිකව අයිතිකරු විසින් දැරිය හැකි යම් කවරම වූ අලාභහානි කිසිවකට එරෙහිව කුලී ගැණුම්කරු විසින් අයිතිකරු නිදහස් කර, හානිපූරණය කළ යුතු වන අතර, මෙම ගිවිසුමේ 5(ඇ) වගන්තියේ අතුරු විධානයේ දක්වා ඇති පරිදි, යම් රක්ෂණ හිමිකම්පෑමක් යටතේ ලබා දී ඇති රක්ෂණ මුදල්, අයිතකරුට සිදු වූ අලාභහානි පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවක, අයිතිකරුට දැරීමට සිදුවන වියදම් ඇතුළුව, ඉහත සඳහන් කළ පරිදි උපකරණය සම්බන්ධයෙන් අයිතිකරුගේ සියළු වියදම් කුලී ගැණුම්කරු විසින් දැරිය යුතුය.

### 5. රක්ෂණය

අ) සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී සමාගම හරහා තබා ඇති උපකරණ සඳහා කුලී ගැණුම්කරු විසින් එහි/ඔහුගේ පිරිවැයෙන් සෙන්ට්‍රල් ෆිනෑන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර් (පෞද්ගලික) සමාගම හරහා අයිතිකරුට පිළිගත හැකි රක්ෂණකරුවෙකු වෙතින් රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමටත්, මෙහි පහත 2 වන ඇමුණුමේ සවිස්තරව දක්වා ඇති බැදීම් ඉටුකරීමටත්, එකී රක්ෂණ ඔප්පුව මෙම ගිවිසුමේ කාලසීමාව තුළ සම්පූර්ණ බලයෙන් හා ප්‍රතිඵලයෙන් තබාගැනීම සඳහා රක්ෂණ වාරික අයවිය යුතු වන පරිදි සහ අයවිය යුතු වන අවස්ථාවේ දී නියමිත වේලාවට එකී රක්ෂණ ඔප්පුව සඳහා සියළුම රක්ෂණ වාරික ගෙවීමටත්, කුලී ගැණුම්කරු මෙයින් එකඟ වේ.

ආ) කුලී ගැණුම්කරු විසින් උපකරණය රක්ෂණය කර තබාගැනීම පැහැර හැරීම කළහොත් හෝ එසේ කර ඇති විටක, රක්ෂණ වාරික අයවිය යුතුව තිබිය දී නියමිත පරිදි ගෙවීම පැහැර හැරීම කළහොත්, අවස්ථාවෝචිත පරිදි, උපකරණ සඳහා රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමට සහ පවත්වාගෙන යාමට නැතහොත් කුලිකරු විසින් ගෙවිය යුතු එහෙත් නොගෙවන ලද යම් කවරම වූ රක්ෂණ වාරිකයක් ගෙවීමට අයිතිකරුට හිමිකම තිබිය යුතු වන අතර, ඉන්පසුව, කුලී ගැණුම්කරුගෙන් කුලී ලෙස ලැබෙන යම් කවරම වූ මුදලක්, අයිතිකරු විසින් ගෙවන ලද මුදල නිදහස් කිරීමේ දී පළමුව යොදවා ගැනීමට අයිතිකරුට හිමිකම තිබිය යුතුය.

ඇ) මෙහි පහත 5 වන වගන්තියට අනුව ලබාගත් යම් කවරම වූ රක්ෂණ ඔප්පුවක් මත ගෙවන ලද රක්ෂණ ලත්මුදල්, මෙම ගිවිසුම යටතේ උපචිත පොලී සහ හිඟ මුදල්, මාසික කුලී හෝ පොලී පිරිවැය, ගාස්තු හෝ අන්‍යාකාරයක වියදම් අන්දමින් කුලී ගැණුම්කරුගෙන් අයිතිකරුට තත්කාලයේ ගෙවිය යුතු සියළුම මුදල් ගෙවීම සඳහා අයිතිකරු විසින් පළමුව යෙදවිය හැකි වන අතර, ශේෂ මුදලක් (වේනොත්) හෝ කුලී ගැණුම්කරුගෙන් අයවිය යුතු එවැනි මුදලක් නොවේ නම්, එවැනි රක්ෂණ මුදල්වල සම්පූර්ණ මුදලම යෙදවිය යුත්තේ:

i. උපකරණයට සිදුවන හානිය සමනය කිරීමට හැකිවන ලෙස උපකරණයට සිදුවන යම් කවරම වූ හානියක් සම්බන්ධයෙන් රක්ෂණ මුදල් ගෙවන විට, උපකරණයට සිදුවන හානිය සමනය කිරීමටත්;

ii. උපකරණ නැති වූ විට හෝ සොරකම් කරන ලද විට හෝ අලුත්වැඩියා කළ නොහැකි තරමට හානි වූ විට, උපකරණ නැති වූ, සොරකම් කරන ලද හෝ එසේ හානි වූ දිනට හෝ ඊට පසුව (අවස්ථාවෝචිත පරිදි,) ගෙවිය යුතු, මෙහි පහත උපලේඛනයේ සඳහන්, මාසික කුලීවල එකතුව පෙන්නුම් කරන මුදලක් අයිතිකරුට ගෙවීමටත් අතිරික්තය කුලී ගැණුම්කරුට ගෙවීමටත්ය.

එසේ වුව ද, ඉතිරි රක්ෂණ මුදල්, ඉහත (i) හි සඳහන් උපකරණයට සිදුවන හානිය සමනය කරගැනීමේ පිරිවැය පියවා ගැනීමට හෝ ඉහත (ii) හි සඳහන් මුළු මාසික කුලිය පෙන්නුම් කරන මුදල ගෙවීමට ප්‍රමාණවත් නොවේ නම්, ඌනතා මුදල, අයිතිකරු වෙත, ඉල්ලුවිට, කුලී ගැණුම්කරු විසින් වහාම ගෙවිය යුතුය.

### 6.කුලී ගැණුම්කරු විසින් ගෙවීම පැහැර හැරීම

අයිතිකරුට ලබාගත හැකි වෙනත් කිසිදු පිළියමකට අගතියක් නොවන පරිදි,

අ) මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු මාසික කුලී ගෙවීමක් හෝ වෙනත් මුදලක් කුලී ගැණුම්කරු විසින් නිසි පරිදි නියමිත වේලාවට ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, ගෙවිය යුතු මුදලට අමතරව, ගෙවිය යුතු මුදලින් මසකට සියයට දඩයක් ලෙස නොව, ප්‍රමාණ කළ අලාභ ලෙස කුලී ගැණුම්කරු විසින් ගෙවිය යුතු වන අතර, රැස් කරන මුළු මුදල, ගෙවිය යුතු ඕනෑම කල් ඉකුත් වූ කුලී ගෙවීමක් හෝ මෙම ගිවිසුම යටතේ වෙනත් මුදලක් සහ උපචිත පොලිය පියවීම පිණිස යෙදවීමට අයිතිකරුට අයිතියක් තිබිය යුතුය.

ආ) මෙම ගිවිසුමේ දක්වා ඇති කරුණු කිසිවක් සම්බන්ධයෙන් ගෙවීමක් කිරීම කුලී ගැණුම්කරු විසින් පැහැර හැරීම කළහොත් සහ එකී කරුණු කිසිවක් සම්බන්ධයෙන් අයිතිකරු විසින් ගෙවීම් කිරීම කරනු ලැබුවහොත්, අයිතිකරු එසේ කිරීමට තීරණය කළහොත්, කුලී ගැණුම්කරුගෙන් කුලී ලෙස ලැබෙන යම් කවරම වූ මුදලක්, අයිතිකරු විසින් ගෙවන ලද මුදල සහ ඒ මත උපචිත පොලිය, වේනොත්, එකී පොලිය පියවීමට පළමුව යෙදවීමට අයිතිකරුට හිමිකම තිබිය යුතුය.

## සිංහල පරිවර්තනය

ඇ) මෙම ගිවිසුම යටතේ අයවිය යුතු මුදල ඉක්මවා අයිතිකරුට ලැබෙන යම් මුදලක්, යම් වෙනත් ඕනෑම ගිවිසුමක් සම්බන්ධයෙන් කුලී ගැණුම්කරු ගෙන් අයිතිකරුට අයවිය යුතු සහ ගෙවිය යුතු ඕනෑම මුදලක් සම්බන්ධයෙන් හිලව් කිරීමට අයිතිකරුට අයිතිය තිබෙන බවට කුලී ගැණුම්කරු විසින් මෙයින් එකඟ වී කැමැත්ත පළකරනු ලැබේ.

### 7.මූල්‍ය සහාය

කුලී ගැණුම්කරු ඉල්ලා සිටින්නේ නම්, අයිතිකරු විසින් තීරණය කරනු ලබන මූල්‍ය සහායක් අයිතිකරු විසින් කුලී ගැණුම්කරුට ලබාදිය හැකිය. එවැනි මූල්‍ය සහායක් සැපයීමට අයිතිකරුට කිසිදු බැඳීමක් නොමැති අතර, එවැනි මූල්‍ය සහායක් ප්‍රදානය කිරීම, අයිතිකරු විසින් නියම කරන නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව, අයිතිකරුගේ පරම අභිමතය පරිදි සිදුවේ.

### 8.දැන්වීම්

පහත සඳහන් සිදුවීම් උද්ගතවීම හෝ එවැනි සිදුවීමක් කුලී ගැණුම්කරු විසින් මුලින්ම සැලකූවිට හෝ දැනගත් විට කුලී ගැණුම්කරු විසින් අයි තිකරුට වහාම දැනුම් දිය යුතුය.එනම්,

අ) උපකරණය තබා ඇති ලිපිනය (මෙම ගිවිසුමේ මෙහි පහත "අ" උපලේඛනයේ (7) වන අයිතමයේ දක්වා ඇති ස්ථානය) සහ එම ස්ථානය කුලියට හෝ බද්දට දී ඇති ඉඩම් හිමියාගේ නම සහ ලිපිනය වෙනස් වීම;

ආ) මෙහි පහත "අ" උපලේඛනයේ 6 වන අයිතමයේ දක්වා ඇති පරිදි, උපකරණ භාවිතා කිරීමට අවසර දී ඇති කාර්යය වෙනස් කිරීම සහ එකී කාර්යය වෙනස් කිරීම හේතුවෙන් උපකරණයට නිරාවරණය වන අවදානම්වල වෙනස්වීම්.

ඇ) උපකරණ සම්බන්ධ ඕනෑම හදිසි අනතුරක් හෝ වෙනත් සිදුවීමක් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඊට හානි සිදුවීම හෝ වෙනත් ඕනෑම උපකරණයකට හෝ දේපළකට හානි සිදුවීම හෝ තෙවන පාර්ශ්වයකට ශාරීරිකව තුවාල සිදුවීම;

ඈ) උපකරණ නැතිවීම හෝ සොරකම් කිරීම හෝ උපකරණය භාවිතය සම්බන්ධයෙන් කිසියම් අවස්ථානුගත තත්වයක් සිදුවීම, එමඟින් යම් කවරම වූ නීතියක් ක්‍රියාත්මක වී මත, උපකරණය සම්බන්ධයෙන් අයිතිකරුගේ හිමිකම අවදානමට ලක්වීම සහ එමෙන්ම උපකරණ භාවිතය හේතුවෙන්, උපකරණය වාහනයක් නම්, කුලී ගැණුම්කරුට හෝ උපකරණයේ රියදුරාට එරෙහිව නඩු පැවරිය හැකි ඕනෑම සිදුවීමක් හෝ අවස්ථානුගත තත්වයක්;

ඉ) උපකරණයේ සුවිශේෂී ලියාපදිංචි අංකය, එය වාහනයක් නම්, අංකය වෙන් කළ වහාම එම අංකය හෝ දැනටමත් ලබා දී ඇති ඕනෑම අංකයක් මෝටර් රථ වාහන රෙජිස්ට්‍රාර්වරයා හෝ වෙනත් නිසි බලධාරියෙකු විසින් වෙනස් කරනු ලැබූ විට එවැනි යම් කවරම වූ අංකයක්;

ඊ) අයිතිකරු විසින් කරන ලද ඉල්ලීමක් මත, කුලී ගැණුම්කරුගේ මූල්‍ය තත්ත්වය සහ අයිතිකරු විසින් නියම කරන, උපකරණයේ ස්ථානය, ස්වභාවය සහ තත්ත්වය පිළිබඳව වැදගත් වන එවැනි තොරතුරු අයිතිකරුට ලබාදීම කළ යුතුය;

### 9.කුලී ගැණුම්කරු විසින් ගිවිසුම අවසන් කිරීම

අ) කුලී ගැණුම්කරු විසින්, මෙම ගිවිසුම යටතේ අවසන් ගෙවීම සිදුකිරීමට නියමිත අවස්ථාවට පෙර ඕනෑම අවස්ථාවක, ගිවිසුම අවසන් කිරීම පිළිබඳ සිය අභිප්‍රාය පිළිබඳව අයිතිකරුට ලිඛිතව දින දහහතරකට (14) නොඅඩු දැන්වීමක් භාර දී, උපකරණයට අදාළව කුලී ගැණුම්කරු සතුව ඇති සියළුම ලියකියවිලි සමඟ, එකී උපකරණය අයිතිකරුට නැවත භාර දීමෙන් පසුව, අයිතිකරු වෙත මෙහි පහත සඳහන් මුදල් ගෙවීමෙන් මෙම ගිවිසුම අවසන් කළ හැකිය.

i. කුලී සින්නක්කර මිල සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් සහ මෙහි පහත "ආ" උපලේඛනයේ දක්වා ඇති ආකාරයට කුලී ගැණුම්කරු විසින් ගෙවා නොමැති මුදල්; සහ

ii. ඉහත සඳහන් කළ පරිදි කුලී ගැණුම්කරු විසින් මෙම ගිවිසුම අවසන් කිරීම හේතුවෙන්, පනතේ 8 වන වගන්තියේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උපකරණයේ කුලී සින්නක්කර මිලෙන් අඩකට සමාන මුදලක්;

ආ) කුලී ගැණුම්කරු විසින්, ඉහත සඳහන් කළ පරිදි උපකරණය අයිතිකරුට නැවත භාරදීමේ දී, උපකරණයට අදාළව කුලී ගැණුම්කරු සතුව ඇති සියළුම ලියකියවිලි භාර දිය යුතු අතර, කුලී ගැණුම්කරු උපකරණයේ අයිතිකරු ලෙස සටහන් කර ඇති යම් කවරම වූ ව්‍යවස්ථාපිත ආයතනයක ලියාපදිංචියක් අවලංගු කිරීමට අවශ්‍ය විය හැකි ඕනෑම පියවරක් ගත යුතුය.

ඇ) 9 වන වගන්තියේ (අ) උපවගන්තියේ සඳහන් ගෙවීම්, පනත සහ/හෝ මෙම ගිවිසුම යටතේ අයිතිකරුට ලබා ගත හැකි වෙනත් කිසිදු පිළියමක් හෝ පිළියම්වලට අගතියකින් තොරව, කුලී ගැණුම්කරු විසින් සිදුකරනු ලැබිය යුතුය.

### 10. අයිතිකරු විසින් ගිවිසුම අවසන් කිරීම

අ) මෙම ගිවිසුමේ දක්වා ඇති පරිදි, කුලී ගැණුම්කරු විසින් මාසික කුලිය ගෙවීමේ දී, එක් මාසික කුලියකට වඩා වැඩි මාසික කුලී ගණනක් පැහැර හරින විටක දී, මෙම ගිවිසුම අවසන්කිරීම පිළිබඳ සති දෙකකට (2) නොඅඩු ලිඛිත දැනවීමක් අයිතිකරු විසින් කුලී ගැණුම්කරු වෙත භාරදීමෙන් මෙම ගිවිසුම අවසන් කිරීමට අයිතිකරුට අයිතිය තිබිය යුතුය.

එසේ වුව ද, මාසික කුලී හිඟ මුදල් (සම්පූර්ණ හිඟ මුදල්) සහ මෙම ගිවිසුමේ නියමයන් යටතේ ඒ මත ගෙවිය හැකි පොලිය, එකී සති දෙකක (2) කාලය ඉකුත්වීමට පෙර කුලී ගැණුම්කරු විසින් අයිතිකරුට ගෙවන්නේ නම්, අයිතිකරු විසින් මෙම ගිවිසුම අවසන් නොකළ යුතුය.

ආ) කුලී ගැණුම්කරු විසින් උපකරණ සම්බන්ධයෙන් මෙම ගිවිසුමේ යම් කවරම වූ කොන්දේසියකට අනුකූල නොවන යම් ක්‍රියාවක් සිදුකරන්නේ නම්, හෝ මෙම ගිවිසුමේ කිසියම් ප්‍රකාශිත කොන්දේසියක් කඩකිරීම මත, එකී කඩකිරීම හෝ ක්‍රියාව නිශ්චිතව දක්වමින්, කුලී ගැණුම්කරුට දින තිහකට (30) නොඅඩු ලිඛිත දැන්වීමක් භාරදීමෙන් මෙම ගිවිසුම අවසන් කිරීමට අයිතිකරුට හිමිකමක් තිබිය යුතු බවට විධිවිධාන සලසමින් මෙම ගිවිසුමේ යම් ප්‍රකාශිත කොන්දේසියක කඩකළ විටක දී, මෙම ගිවිසුම අවසන් කිරීමට ඔහුට හිමිකමක් ඇත;

මෙම වගන්තියේ කාර්යය සඳහා, පහත සඳහන් යම් කවරම වූ අවස්ථානුගත තත්වයක් එකී කුලියට ගැනීම උල්ලංඝනය කිරීමකට සමාන වන බවට සහ කුලියට ගැනීම උල්ලංඝනය කිරීමක් වන බවට වටහාගත යුතු බවට කුලී ගැණුම්කරු විසින් එකඟවනු ලැබේ;

අ.i. උපකරණය කුලී ගැණුම්කරුගේ සන්තකයේ තබා ගැනීම පැහැර හැරීම;

අ.ii. උපකරණය පැවරීම, උකස් කිරීම විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම හෝ අයිතිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කළ හැකි වෙනත් ඕනෑම ක්‍රියාවක් සිදුකිරීම;

අ.iii. උපකරණය මනා ක්‍රියාකාරීත්වයෙන් හෝ යහපත් තත්ත්වයෙන් තබා ගැනීමට අපොහොසත් වීම;

අ.iv. රජයේ බලධාරීන්ගේ සියළුම රෙගුලාසි සහ උපදෙස් සහ එවැනි උපකරණ භාවිතය සම්බන්ධයෙන් සාදන ලද සියළුම පාර්ලිමේන්තු පනත්, ප්‍රඥප්ති සහ නීති රීතිවලට අනුකූල වීමට සහ අනුගත වීමට අපොහොසත් වීම සහ එහි 2 වන වගන්තියේ සහ මෙහි I වන පරිශිෂ්ටයේ 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම;

**සිංහල පරිවර්තනය**

අ.v. මෙහි II වන පරිශිෂ්ටයේ 5 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම;

අ.vi. මෙම ගිවිසුමේ 7 වන වගන්තියට අනුව, මූල්‍ය සහාය ප්‍රදානය කිරීම සඳහා අයිතිකරු සමඟ ඇති කර ගත් යම් කවරම වූ ගිවිසුමක් කුලී ගැණුම්කරු විසින් පැහැර හැරීම/කඩකිරීම.

එසේ වුව ද, දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාව හෝ උල්ලංඝනය කිරීම කුලී ගැණුම්කරු විසින් නිවැරදි කළ හැකි ඕනෑම අවස්ථාවක, පැමිණිලි කරන ලද උල්ලංඝනය හෝ ක්‍රියාව, එකී දින තිහක (30) කාල සීමාව ඉකුත්වීමට පෙර නිවැරදි කරන ලෙස අයිතිකරු විසින් එකී දැන්වීමෙන් කුලී ගැණුම්කරු වෙත නියම කළ යුතු අතර, පැමිණිලි කරන ලද උල්ලංඝනය හෝ ක්‍රියාව, කුලී ගැණුම්කරු විසින් එකී දින තිහක (30) කාල සීමාව ඉකුත්වීමට පෙර නිවැරදි කළ කරන්නේ නම්, එකී දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති හේතු මත අයිතිකරු විසින් මෙම ගිවිසුම අවසන් නොකළ යුතුය.

ඇ) 10 වන වගන්තියේ (අ) සහ (ආ) උපවගන්ති යටතේ ලබා දී ඇති අවසන් කිරීමේ දැන්වීමක්, කුලී ගැණුම්කරුට කිසිදු හේතුවක් හෝ දැනුම්දීමක් භාරදීමකින් තොරව අයිතිකරු විසින් අත්හැරීම කළ හැකි අතර, මෙම ගිවිසුම යටතේ සහ ප්‍රකාරව කුලී ගැණුම්කරු සමඟ කටයුතු කිරීම දිගටම කරගෙන යාම කළ හැකිය.

ඇ) එපරිදි අවසන් කිරීමෙන් පසුව, උපකරණය සන්තකයේ තබාගැනීමට සහ භාවිතා කිරීමට කුලී ගැණුම්කරුට අවසරයක් සහ බලපත්‍රයක් නොලැබෙන අතර, උපකරණය ප්‍රධාන කාර්යාලයට /නගර කාර්යාලයට හෝ අයිතිකරුගේ ආසන්නතම ශාඛාවට ආපසු භාරදිය යුතුය. කුලී ගැණුම්කරු උපකරණය ආපසු භාරදීම පැහැර හැරීම කරන විට, කුලී ගැණුම්කරුට කිසිදු පූර්ව දැන්වීමක් භාරදීමකින් හෝ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමකින් තොරව, පහත සඳහන් පරිදි එහි සන්තකය වහාම ආපසු ලබාගැනීමට අයිතිකරුට අයිතියක් තිබිය යුතුය.

අ.i. උපකරණ නැවත අත්පත් කරගැනීමට අයිතිකරුට හෝ අයිතිකරුගේ නිසි බලයලත් නියෝජිතයාට හෝ නාමිකයාට අයිතිය ඇති බවත්, නැවත අත්පත් කර ගැනීමට විරුද්ධ වීමට කුලී ගැණුම්කරුට කිසිදු අයිතියක් නොමැති බවත්, කිසිදු ප්‍රතිරෝධයක් නොදක්වන බවත් මෙයින් විශේෂයෙන් එකඟ වේ.

**11. දැනුම්දීමකින් තොරව අවසන් කිරීම**

කුලියට දීම අඛණ්ඩව සිදුවන අතරතුර -

අ) කුලී ගැණුම්කරුගේ මරණය සිදුවුවහොත් ; හෝ

ආ) කුලී ගැණුම්කරු වස්තුභංගත්වයට ගැනෙන ක්‍රියාවක් සිදුකළහොත් හෝ ණයගැතිභාවයට ලක්ව ඇති බවට විනිශ්චය කරනු ලැබුවහොත් හෝ ණයගැතිභාවයට ලක්වීමෙන් සිය දේපළ තහනමට ගැනීම පිණිස පෙත්සමක් ගොනු කළහොත්; හෝ

ඇ) කුලී ගැණුම්කරු තම ණයහිමියන් සමඟ යම් කවරම වූ වැඩපිළිවෙලකට එළඹීම, හෝ ඔවුන් සමඟ සම්මුතියකට එළඹීම, හෝ ඔවුන්ගේ ප්‍රතිලාභය සඳහා කිසියම් පැවරුමක් කිරීම සිදුකළහොත්; හෝ කුලී ගැණුම්කරු බංකොලොත් භාවයට පත්වුවහොත්; හෝ

ඇ) කුලී ගැණුම්කරු සමාගමක් වන විට, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා යෝජනා සම්මතයක් සම්මත කිරීම හෝ ගණන් බේරා වසා දැමීම සඳහා අධිකරණයක් විසින් නියෝගයක් නිකුත් කළහොත්; හෝ

(ඉ) උපකරණය හෝ කුලී ගැණුම්කරුගේ යම් කවරම වූ දේපළකට කිසියම් ඇකිසියක්, තහනම් කිරීමක් හෝ දේපල තහනමක් නිකුත් කිරීම හෝ පැනවීම කළහොත් හෝ උපකරණ කිසියම් ලියමක් හෝ වෙනත් අයකිරීමක් යටතේ රඳවා තබා ගැනීම කළහොත්; හෝ

ඊ) උපකරණයේ වත්මන් රක්ෂණ ඔප්පුව රක්ෂණකරු විසින් අවලංගු කරනු ලැබීම හෝ ඉල්ලා අස්කර ගනු ලැබීම කළහොත්;

ඉහත සඳහන් ඕනෑම සිදුවීමක් සිදු වූ විට, කුලියට දීම ස්වයංක්‍රීයව සහ දැනුම්දීමකින් තොරව අවසන් වේ.

**12.අධිකරණ බලය**

කුලී ගැණුම්කරු විසින් අයිතිකරුට ගෙවිය යුතු කුලී මුදල්, අලාභහානි, රක්ෂණ වාරික, ක්ෂයවීම් සඳහා වන්දි ආදිය ඇතුළුව සියළුම මුදල්, වෙනත් ස්ථානයක දී නොව, අංක 84, රජ වීදිය, මහනුවර/අංක 270, වොක්ෂෝල් වීදිය, කොළඹ 2 යන ලිපිනයේ පිහිටි අයිතිකරුගේ ප්‍රධාන කාර්යාලයේ දී/නගර කාර්යාලයේ දී ගෙවිය යුතු වේ. කුලී ගැණුම්කරු විසින් වෙනත් ස්ථානයකට හෝ වෙනත් ඕනෑම ප්‍රභවයක් හෝ අයිතිකරුගේ වෙනත් ශාඛාවක් හරහා ගෙවීම් කරන විටක දී, එම මුදල් අයිතිකරු විසින් හෝ අයිතිකරු වෙනුවෙන් පිළිගනු ලැබුව ද, අයිතිකරුගේ ප්‍රධාන කාර්යාලයේ දී/නගර කාර්යාලයේ දී පමණක් ගෙවීමට ඇති ඉහත සඳහන් බැඳීම නොවෙනස්ව පවතිනු ඇත. ඉහත කී ගෙවීම් අයිතිකරුගේ ප්‍රධාන කාර්යාලයේ දී/නගර කාර්යාලයේ දී පමණක් සිදු කිරීමේ බැඳීම, අයිතිකරුගේ ප්‍රධාන කාර්යාලයේ දී/නගර කාර්යාලයේ දී හැර, වෙනත් තැනක දී මුදල් ගෙවීම පිළිගැනීමෙන් අත්හැරීමක් හෝ වෙනස් කිරීමක් හෝ අහෝසි කිරීමක් අදහස් නොකරන අතර, ඉහත සඳහන් ගෙවීම් කිසිවක් සිදුකිරීමට අපොහොසත් වුවහොත් එසේ අත්හැරීමක් හෝ වෙනස් කිරීමක් හෝ අහෝසි කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර, එහි දී, නඩු කටයුතු කිසිවක් ආරම්භ කිරීමේ අරමුණු සඳහා වන නඩු නිමිති, අයිතිකරුගේ ප්‍රධාන කාර්යාලය/නගර කාර්යාලය පිහිටා ඇති නිසි අධිකරණයේ අධිකරණ බලයසීමාව තුළ පැන නැඟේ. "නඩු නිමිති යන්නෙන්, නඩු කටයුතු කිසිවක් පැවරීමට නියමිත මෙම ගිවිසුම යටතේ ඇති බැඳීම් කඩකිරීමක් වේ."

**13.පැවරීම**

මෙම ගිවිසුම යටතේ අයිතිකරුගේ අයිතිය, හිමිකම, බුක්තිය සහ බැඳීම් වෙනත් ඕනෑම පාර්ශ්වයකට පැවරීමට අයිතිකරුට අයිතිය ඇති බවට කුලී ගැණුම්කරු විසින් මෙයින් කැමැත්ත පළකර වී එකඟ වේ.

**14.විවිධ**

අ) පනතේ 16(6) වගන්තියේ කාර්යය සඳහා උපකරණයේ වටිනාකම තීරණය කරන තැනැත්තා බලයලත් අලෙවිකරු සහ/හෝ --හෝ අයිතිකරු විසින් නම් කරන, සහ ශ්‍රී ලංකා ලීසිං සංගමයේ ලියාපදිංචි, ඕනෑම තක්සේරුකරුවෙකු විය යුතු බවට මෙයින් තවදුරටත් එකඟ වේ.

ආ) මෙහි පහත උපලේඛන සහ මෙහි ඇමුණුම් මෙම ගිවිසුමේ කොටසක් විය යුතුය.

ඇ) මෙම ගිවිසුමේ කිසියම් කොටසක්, නියමයක් හෝ විධිවිධානයක් ශූන්‍ය, අවලංගු, හෝ අක්‍රිය ලෙස සලකනු ලැබුවහොත්, සංශෝධිත 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතට පටහැනි, හෝ අන්‍යාකාරයකින් අවලංගු වන බවට සලකනු ලැබුවහොත්, ඉතිරි කොටස හෝ කොටස් වෙන් කළ හැකි කොටස හෝ කොටස් ලෙස සලකනු ලබන අතර, එවැනි තීරණයකින් බලපෑමට ලක්නොවන අතර, පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම්, ගිවිසුමේ එවැනි ශූන්‍ය, අවලංගු හෝ අක්‍රිය ලෙස සලකනු ලබන සුවිශේෂිත කොටස, නියමය හෝ විධිවිධාන අඩංගු නොවූවාක් මෙන්, වටහා ගැනීමත්, බලාත්මක කිරීමත්කරනු ලැබිය යුතුය.

**සිංහල පරිවර්තනය**

**"අ" උපලේඛනය**

**(1) වන අයිතමය : කුලී ගැණුම්කරුගේ විස්තර**
කුලී ගැණුම්කරුගේ නම
ජාතික හැඳුනුම්පත් අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය
නේවාසික ලිපිනය
**(2) වන අයිතමය : උපකරණයේ විස්තරය**
උපකරණයේ වර්ගය සහ මාදිලිය
උපකරණ බඳේ වර්ගය
එන්ජිම අංකය   චැසි අංකය
උපකරණයට අදාළ උපාංග සහ උපකරණ
මෙම ගිවිසුම යටතේ සපයන උපකරණ කලින් භාවිතා කරන ලද අතර, කුලී ගැණුම්කරුඒ බව පිළිගනී.
**(3) වන අයිතමය :** කුලී ගැණුම්කරුට අත්පිට මිල (Cash Price) දැනුම් දුන් දිනය:
**(4) වන අයිතමය :** උපකරණය විකුණන්නා/සැපයුම්කරු:
**(5) වන අයිතමය :** විකුණුම්කරු/සැපයුම්කරු විසින් අපේක්ෂිත භාරදීමේ දිනය:
**(6) වන අයිතමය :** උපකරණ භාවිතා කිරීමට අවසර දී ඇති කාර්යය:
**(7) වන අයිතමය :** උපකරණ භාරදීමට සහ තබාගැනීමට නියමිත ස්ථානය:
**(8) වන අයිතමය :** කුලී සින්නක්කර කාලසීමාව: කුවිතාන්සිය භාරගැනීමේ දින සිට මාස

**"ආ" උපලේඛනය**

**යෝජිත කුලී සින්නක්කර ගිවිසුම යටතේ ඔබගේ (කුලී ගැණුම්කරුගේ) මූල්‍ය බැඳීම්වල සාරාංශය**

| | | |
|---|---|---|
| (1) වන අයිතමය | : | භාණ්ඩවල අත්පිට මිල (Cash Price)<br>සවිකිරීමේ ගාස්තු<br>එකතුව |
| (2) වන අයිතමය | : | ව්‍යවස්ථාපිත ගාස්තු සහ තැන්පතු ඇතුළුව කුලී සින්නක්කර මිල |
| (3) වන අයිතමය | : | කුලී සින්නක්කර මිලට පහත මුදල් ඇතුළත් කර ඇත.<br>(අ) භාණ්ඩ ප්‍රවාහන ගාස්තු (භාණ්ඩ හෝ ඒවායින් කිසිවක් කුලී ගැණුම්කරුට හෝ කුලී ගැණුම්කරුගේ ඇණවුමට බෙදා හැරීමේ වියදම්)<br>(ආ) ඕනෑම නීතියක් යටතේ ගෙවිය යුතු ලියාපදිංචි හෝ වෙනත් ගාස්තු<br>(ඇ) රක්ෂණය<br>(ඈ) සවිකිරීමේ ගාස්තු<br>(ඉ) ව්‍යාපාර පිරිවැටුම් බද්ද හෝ වෙනත් බදු |
| (4) වන අයිතමය | : | ගෙවිය යුතු වාරික සහ එවැනි වාරික ගෙවිය යුතු කාල පරතරය පහත පරිදි වේ. වන පරිදි මාසික කුලිය කි. එක් එක් කුලිය අයිතිකරුගේ ප්‍රධාන/නගර කාර්යාලයේ දී මාසිකව ගෙවිය යුතු අතර, පළමු කුලිය, භාරගැනීමේ කුවිතාන්සිය හෝ මෙම ගිවිසුම නිකුත් කළ දිනයේ දී ම අයවිය යුතු සහ ගෙවිය යුතු වේ. |
| (5) වන අයිතමය | : | අයිතිකරුගේ ලිඛිත අවසරය ඇතිව, ඔබට කුලී සින්නක්කර ගිවිසුම යටතේ ඔබේ අයිතිවාසිකම් පැවරිය හැකි අතර, ඔහු අසාධාරණ ලෙස ඔහුගේ කැමැත්ත ප්‍රතික්ෂේප නොකළ හැකිය. |
| (6) වන අයිතමය | : | සංශෝධිත 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 7 වන වගන්තිය ප්‍රතිදානයක්/ වට්ටමක් (rebate) සහිතව භාණ්ඩ මිලදී ගැනීමට ඕනෑම අවස්ථාවක ඔබට අයිතිය තිබේ. |
| (7) වන අයිතමය | : | සංශෝධිත 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, භාණ්ඩ ඔබගේම වියදමින් අයිතිකරුට ආපසු භාරදීමෙන් ඕනෑම අවස්ථාවක කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමට ඔබට අයිතියක් ඇත. |

**මීට සාක්ෂි පිණිස,** මෙහි පාර්ශ්වයන් මෙම ගිවිසුමටත් මේ හා සමාන වාසගම දරන තවත් එක් ලියවිල්ලකටත්, මෙහි පහත සඳහන් පරිදි වන දින ලියා අත්සන් තබා ක්‍රියාත්මක කරන්නට යෙදුණි.

අයිතිකාර සමාගම සඳහා සහ වෙනුවෙන් අත්සන් කරන ලද්දේ:

**සාක්ෂි**
නම

## සිංහල පරිවර්තනය

ලිපිනය
අත්සන

### 1 වන ඇමුණුම

**උපකරණය භාවිත කිරීම**

ඇ) උපකරණ භාවිත කිරීම සම්බන්ධයෙන් සාදන ලද සියළුම නීති සහ රෙගුලාසිවලට කුලී ගැණුම්කරු අනුකූල විය යුතුය.
සටහන: පැහැදිලි කරගැනීම සඳහා, නීති සහ රෙගුලාසිවලට පාර්ලිමේන්තු පනත් සහ ඒ යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ නියෝග සහ පළාත් සභා විසින් පනවන ලද ව්‍යවස්ථා ඇතුළත් වේ.

ආ) උපකරණය අයිතිකරු සතු වන බව සඳහන් කරමින් ලේබල්, තහඩු හෝ වෙනත් සලකුණු උපකරණයේ ඇලවීමට අයිතිකරු විසින් කුලී ගැණුම්කරුට උපදෙස් දෙන අවස්ථාවක දී, කුලී ගැණුම්කරු විසින් තමන්ගේම වියදමින් එම උපදෙස් අනුගමනය කළ යුතුය.

ඇ) පනවන ලද සියළුම දඩ මුදල්, යම් කවරම වූ බලපත්‍ර ගාස්තු, තීරුබදු, ලියාපදිංචි ගාස්තු, බදු සහ උපකරණය හෝ එහි භාවිතය සම්බන්ධයෙන් ගෙවිය යුතු අනෙකුත් මුදල් මෙන්ම එවැනි තීරුබදු, ගාස්තු, බදු සහ නිතිපතා කරන වියදපැහැදම් නොගෙවීම නිසා නිසි බලධාරියා විසින් පනවන ලද දඩ මුදල් කුලී ගැණුම්කරු විසින් නියමිත වේලාවට ගෙවිය යුතු වන අතර, මේවායින් කිසිවක් අයිතිකරු විසින් ගෙවනු ලැබුවහොත්, එම ගෙවීමේ සම්පූර්ණ ප්‍රමාණය, ඉල්ලූ විට, කුලී ගැණුම්කරු විසින් අයිතිකරුට වහාම ප්‍රතිපූරණය කළ යුතුය.

**නඩත්තු කිරීම**

ඇ) කුලී ගැණුම්කරු විසින් සෑම විටම උපකරණය මනා මෙහෙයුම් තත්ත්වයකින් සහ යහපත් ක්‍රියාකාරී තත්ත්වයකින් පවත්වා ගත යුතු වන අතර, අවශ්‍ය විටෙක එය අලුත්වැඩියා කළ යුතු වන අතර, උපකරණය භාවිත කිරීම, සේවා කිරීම සහ නඩත්තුව සම්බන්ධයෙන් නිෂ්පාදකයාගේ නිර්දේශ දැඩි ලෙස අනුගමනය කළ යුතුය.

ආ) කුලී ගැණුම්කරු විසින් තමන්ගේම පිරිවැයෙන් සහ වියදමින්, උපකරණයේ යම් කවරම වූ සහ සියළුම කොටස් සහ උපාංග නැවත යෙදීම, උපකරණය අලුත්වැඩියා කිරීම, නිතිපතා සහ සුවිශේෂිත පරීක්ෂණයක් පැවැත්වීම සහ මෙම වගන්තියේ පෙර ඡේදයේ දක්වා ඇති කාර්යය සඳහා සෑම සහ සියළුම නඩත්තු සහ අලුත්වැඩියාවන් සිදුකිරීම කළ යුතුය. කුලී ගැණුම්කරු විසින් අයිතිකරුගේ ලිඛිත අවසරය පළමුව ලබාගෙන ඇත්නම් මිස, ගෙවී ගිය හෝ හානි වූ කොටස් හෝ උපාංග වෙනුවට උපකරණයේ මුල් නිෂ්පාදකයින් විසින් සපයන ලද හෝ නිර්දේශ කරන ලද කොටස් පමණක් කුලී ගැණුම්කරු විසින් අළුතෙන් යෙදිය යුතුය.

**වෙනස්කිරීම්**

ඇ) කුලී ගැණුම්කරු විසින් අයිතිකරුගේ ලිඛිත අවසරයකින් තොරව, උපකරණයට කිසිදු එකතු කිරීමක්, වැඩිදියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ එහි මනා ක්‍රියාකාරීත්වයේ පිළිවෙලට, ක්‍රියාකාරීත්වයට හෝ ගුණාත්මකභාවයට වෙනස්කිරීමක් සිදු නොකළ යුතුය.

ආ) කුලී ගැණුම්කරු විසින් අයිතිකරුගේ අවසරයකින් තොරව, උපකරණයට එකතු කිරීම් හෝ වැඩිදියුණු කිරීම් සිදුකරන්නේ නම්, අයිතිකරු විසින් ඒවා ඉවත් කිරීමට නියම කළ වහාම, කුලී ගැණුම්කරු විසින් ඒවා සිය වියදමින් ඉවත් කිරීම කළ යුතුය.

ඇ) උපකරණයට කරන ලද ඕනෑම එකතු කිරීමක්, වැඩිදියුණු කිරීමක් හෝ වෙනස් කිරීමක් (අයිතිකරුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව,) උපකරණයේම කොටසක් වශයෙන් සමන්විත වියයුතු වන අතර, ඒවා සඳහා අයිතිකරු විසින් කිසිදු වන්දියක් ගෙවීමට බැඳීමකින් තොරව, ඒවා අයිතිකරු සතු විය යුතුය.

**උපකරණය සම්බන්ධ කිරීම හෝ ඇඳීම**

ඇ) කුලී ගැණුම්කරු විසින් අයිතිකරුගේ ලිඛිත අවසරයකින් තොරව, උපකරණ නිශ්චල දේපළවලට සම්බන්ධ කිරීම හෝ ඇඳීම නොකළ යුතුය. උපකරණ නිශ්චල දේපළවලට සම්බන්ධ කිරීම හෝ ඇඳීම හේතුවෙන් එකී උපකරණ ස්ථිර සවිකිරීමේම කොටසක් බවට පත් නොවන බව කුලී ගැණුම්කරු විසින් පිළිගනු ලැබේ.

ආ) උපකරණ නිශ්චල දේපළවලට සම්බන්ධ කිරීමට හෝ ඇඳීමට කුලී ගැණුම්කරු විසින් අයිතිකරුගේ කැමැත්ත ඉල්ලා සිටින අවස්ථාවක දී, එම නිශ්චල දේපළෙහි හිමිකරු හෝ ඉඩම් හිමියා විසින් එම උපකරණය එවැනි නිශ්චල දේපළක කොටසක් වශයෙන් සමන්විත වන තිරවුරු හෝ සවිකිරීමක් ලෙස නොසැලකීමට එකඟ වන බවට දක්වමින් එම නිශ්චල දේපළෙහි හිමියාගෙන් හෝ ඉඩම් හිමියාගෙන් ලබාගන්නා ලිඛිත අවසරයක් හෝ සහතිකයක් කුලී ගැණුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

ඇ) උපකරණය තත්කාලයේ තැබිය හැකි පරිශ්‍රය සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම කුලී සහ අනෙකුත් නිතිපතා කරන වියපැහැදම් කුලී ගැණුම්කරු විසින් නිසි කලට සහ වේලාවට ගෙවන බවට කුලී ගැණුම්කරු විසින් මෙයින් අයිතිකරුට පොරොන්දු වන අතර, එවැනි කුලියක් සහ අනෙකුත් නිතිපතා කරන වියපැහැදම් සම්බන්ධයෙන් තත්කාලයේ ගෙවිය යුතු නවතම ගෙවීම සඳහා වන රිසිට්පත හෝ රිසිට්පත්, ඉල්ලූ විට, අයිතිකරුට ඉදිරිපත් කළ යුතුය.

### 2 වන ඇමුණුම
### උපකරණය රක්ෂණය කිරීම සම්බන්ධ කරුණු

1. ගිවිසුමේ මුළු කාලය තුළ සහ ගිවිසුමේ ඕනෑම දීර්ඝ කළ කාලයක් තුළ,

ඇ) රක්ෂණය, මෙම ලියවිල්ල ලියා අත්සන් කොට ක්‍රියාත්මක කිරීමට පෙර ලබාගත් තක්සේරුවට වඩා අඩු නොවිය යුතු වීම සහ කිසිදු තත්ත්වයක් යටතේ වුව ද, එම වටිනාකම උපකරණයේ සම්පූර්ණ වෙළඳ පොල වටිනාකමට වඩා අඩු නොවිය යුතු වීම; සහ

ආ) මෝටර් රථ වාහන පනතේ විධිවිධානවලට අනුකූලව, උපකරණය, හදිසි අනතුරකින්, ගින්නකින්, සොරකමකින්, කෝලාහලයකින් හෝ සිවිල් සමාජයේ කැලඹීමකින් සිදුවන අලාභයට හෝ හානිවලට එරෙහිව මෙන්ම තෙවන පාර්ශ්වීය අවදානම්වලට එරෙහිව රක්ෂණය කර තිබීම;

යනාදී නියමයන්ට යටත්ව, එකී රක්ෂණය කුලී ගැණුම්කරු විසින් සම්පූර්ණ බලයෙන් සහ අයිතිකරු විසින් නියම කර ඇති අවම නියමයන් සහ ආවරණයට නොඅඩු වන නියමයන් සහ ආවරණය මත තබාගැනීම කුලී ගැණුම්කරුගේ වගකීම වේ.

2. තමන්ට අවශ්‍ය යැයි හැඟෙන පරිදි, අමතර රක්ෂණ ආරක්ෂාවක්/ආවරණයක් ලබාගැනීම කුලී ගැණුම්කරුගේ වගකීම වන අතර, එසේ කිරීමට අපොහොසත් වීමක්, මෙම ගිවිසුම යටතේ ඇති ඔහුගේ/ඇයගේ කිසිදු බැඳීමකින් කුලී ගැණුම්කරුගේ නිදහස් නොකළ යුතුය.

3. රක්ෂණයේ සියළුම නියමයන් සහ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සහ උපකරණයට නිරාවරණය වන අවදානම්වල යම් වෙනසක් සිදුවුවහොත් රක්ෂණකරුවන්ගේ සහ අයිතිකරුගේ අවධානයට වහාම යොමු කිරීම කුලී ගැණුම්කරුගේ වගකීම විය යුතුය.

4. අයිතිකරු රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභියා බවට දක්වමින් රක්ෂණ ඔප්පුවේ පිටපතක් කුලී ගැණුම්කරුවිසින් ලබාගත යුතුය. එබැවින්, යොමු කර ඇති රක්ෂණ ඔප්පුව යටතේ කුලී ගැණුම්කරු විසින් හිමිකම් පෑමක් සිදු කරන්නේ නම්, ඒ හා සම්බන්ධ සියළුම රක්ෂණ මුදල් ලබාගැනීමට කුලී ගැණුම්කරු විසින් අයිතිකරුට සහාය විය යුතුය.

5. අයිතිකරු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින විට, උපකරණය සම්බන්ධයෙන් ලබාගත් රක්ෂණ ඔප්පුව සඳහා ගෙවන ලද රක්ෂණ වාරික සඳහා වන රිසිට්පත් සහ වත්මන් රක්ෂණ සහතිකය කුලී ගැණුම්කරු විසින් වහාම ඉදිරිපත් කළ යුතුය.

**සිංහල පරිවර්තනය**

6. මෙහි සඳහන් රක්ෂණ ඔප්පුව යටතේ අයකර ගැනීම සම්බන්ධයෙන් කුලී ගැණුම්කරුගේ අපොහොසත් වීමක් මෙම ගිවිසුම යටතේ කුලී ගැණුම්කරුට ඇති වගකීමෙන් කුලී ගැණුම්කරු නිදහස් කිරීමක් නොවිය යුතුය.

7. රක්ෂණ ඔප්පුව යටතේ හිමිකම් පෑමක් කළ හැකි තත්වයක් ඇති වුවහොත්, කුලී ගැණුම්කරු විසින් එවැනි සිදුවීමක් පිළිබඳව රක්ෂණකරුට සහ අයිතිකරුට වහාම දැනුම් දිය යුතු අතර, රක්ෂණ ඔප්පුව යටතේ හිමිකම් පෑම, අදාළ සියළු ලියකියවිලි ද සමඟ, අයිතිකරුට පිටපතක් ද සහිතව රක්ෂණකරුට වහාම ඉදිරිපත් කළ යුතුය.

**සිංහල පරිවර්තනය නිවැරදි බවට සහතික කරමි.**